# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1873/39 - 2014 අගෝස්තු මස 01 වැනි සිකුරාදා - 2014.08.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/10/52/2010

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.01.03 වැනි දිනැති හා අංක 1739/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.12.23 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ජා ඇල, කපුවත්ත, නො. 422/5 හි පදිංචි කේ. ඩබ්. පෙරේරා මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් බත්තරමුල්ල, රජමල්වත්ත පාර, නො. 82 හි පිහිටි රාජ්‍ය දැව සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.06.27 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්. ජේ. එල් යූ. විජයවීර,
*වැ.බ. කම්කරු කොමසාරිස්.*

2014 ජූලි මස 25 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/10/52/2010

කාර්මික අධිකරණයේ දී ය.

කේ. ඩබ්. පෙරේරා මයා,
නො. 422/5,
කපුවත්ත,
ජා ඇල.

*(ඉල්ලුම්කරු)*

නඩු අංකය ඒ/3428

එදිරිව

රාජ්‍ය දැව සංස්ථාව,
නො. 82,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

*(වගඋත්තරකරු)*

ප්‍රදානය

1957 අංක 14 සහ 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධි විධාන) පනත සමග කියැවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල (3) වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ගරු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2011.12.23 දින මා පත් කොට මා වෙත යොමු කොට ඇත.

02. දෙපාර්ශවය අතර පවත්නා කාර්මික ආරාවුලට හේතු වී ඇති කරුණු වනුයේ :-

(අ) "පැමිණිලිකාර කේ. ඩබ්. පෙරේරා මහතා 2003 වර්ෂයේ සිට රාජ්‍ය දැව සංස්ථාවේ නියෝජ්‍ය කළමනාකරු (පාලන) ලෙස සේවය කර ඇතත්, ඔහු සිය තනතුරට අදාළ වැටුපෙහි නොපිහිටවීම මගින් ඔහුට යම් අසාධාරණයක් සිදු වී ඇත්ද,



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) ඒ අනුව අදාළ වැටුපෙහි පිහිටුවන ලෙසට ඔහු විසින් රාජ්‍ය දැව සංස්ථාවෙන් කරන ලද ඉල්ලීම යුක්තිසහගත ද ? යුක්තිසහගත වන්නේ නම් ඔහුට ලැබිය යුතු සහනය කුමක් ද" යන්න පිළිබඳව වේ.

03. දෙපාර්ශවයේ ප්‍රකාශ හුවමාරු වීමෙන් පසු 2012.09.20 වැනි දින ඉල්ලුම්කරු වෙනුවෙන් වයි. එම්. පුංචි බණ්ඩා මහතා පෙනී සිටිමන් ඔහුගේ මෙහෙයවීම යටතේ ඉල්ලුම්කරු සාක්ෂි ආරම්භ කරන ලදී.

04. වගඋත්තරකාර දැව සංස්ථාව වෙනුවෙන් නීතිඥ කේ. කුරුවිට බණ්ඩා මහත්මිය පෙනී සිටි අතර, ආයතනය වෙනුවෙන් නියෝජ්‍ය කළමනාකරු (පාලන) ජෝෂප් ද සිල්වා මහතා පැමිණ සිටින ලදී.

05. ආරවුල පිළිබඳ තීරණය ලබාදීමේදී දෙපාර්ශවය ඉදිරිපත් කල වාචික සාක්ෂි හා ලේඛනද, ලිඛිත දේශනයන්ද විශ්ලේෂණය කිරීමෙන් පසු පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) 1996.01.01 වැනි දින සිට අනුරාධපුරයට ස්ථාන මාරු කර ඇත.

(ii) 1996.12.04 වැනි දින සිට පාලන නිලධාරි (විධායක ශ්‍රේණිය iii තනතුරට) පත් කිරීම.

(iii) 1997.03.06 වැනි දින පාලන නිලධාරි උසස්වීම ප්‍රතික්ෂේප කර ඇත.

(iv) දේශපාලන පළිගැනීම් කමිටු වාර්තාව දැව සංස්ථා සභාපතිනිගේ 2004.02.03 වැනි දින දරන ලිපිය අනුව 1996.12.07 වැනි දින සිට iii වැනි ශ්‍රේණියේ පාලන නිලධාරි තනතුරට පත්වීම් ලබාදී කල්පිත වශයෙන් ගණන් බලා හිඟ වැටුප් ගෙවීමකින් තොරව වැටුප් පියවර තීරණය කර එම වැටුප් පියවර මත වැටුප් ගැලපීම සුදුසු බව නිර්දේශ කර ඇත.

(v) එවකට වැටුප් ලබන විධායක II වන ශ්‍රේණියේ වැටුප රු. 11,085 - 460 x 7 - 14,305 දරන වැටුප් පියවර ගෙවිය යුතුව ඇති වුවත්, එවකටත් ලබමින් සිටි වැටුප රු. 14,350/- ක් බැවින් එම වැටුප තවදුරටත් ගෙවීමට සභාපතිනිය නියෝග කර ඇත.

(vi) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන සංස්ථාවලට අදාළ කර ගනුයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සහ භාණ්ඩාගාර කළමනාකරණ දෙපාර්තමේන්තු තීරණ මත බව.

(vii) දෙපාර්ශවය විසින් ඉදිරිපත් කළ සාක්ෂි හා හරස් ප්‍රශ්න කිරීම්ද ඉහත කරුණු සනාථ කර ඇත. දැව සංස්ථාවේ පිරිස් නිලධාරි 2013.08.29 වැනි දින සාක්ෂි දෙමින් කියා ඇත්තේ 2003.01.01 වැනි දිනට වැටුප් උපරිමයව සිටි රු. 14,350/- වැටුප ගෙවන ලද බවයි.

07/2003 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය (පැ/04) දැව සංස්ථාව විසින් සාමාන්‍යාධිකාරීගේ 2004.03.16 වැනි දින අංක 3/307 චක්‍ර ලේඛනයක් මගින් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව 2004.01.01 වැනි දින සිට වැටුප් පියවරේ ගැළපීම් කර ඇති බවට පිරිස් නිලධාරි සාක්ෂි දී ඇත. එසේම වැටුප් වර්ධක ලබා දී, උපරිමය ද ලබා දී ඇති බව කියා ඇත.

2013.06.05 වැනි දින ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී 07/2003 චක්‍ර ලේඛනය ආයතන අධ්‍යක්ෂ නිකුත් කළ බවත්, එය අමතා ඇත්තේ අමාත්‍යාංශ ලේකම්වරු හා පළාත් සභා ප්‍රධාන ලේකම්වරු සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට වන බවත්, එම චක්‍ර ලේඛන සංස්ථාවලට අදාළ වන්නේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා රාජ්‍ය මුල්‍ය ආයතනයේ උපදෙස් මත බවත්, ඉල්ලුම්කරු පිළිගෙන ඇත. ඒ අනුව 07/2003 චක්‍රලේඛන දැව සංස්ථාව ක්‍රියාත්මක කර ඇත්තේ 2004.01.01 වැනි දින සිට බව පෙනේ.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන රාජ්‍ය සංස්ථාවලදී ක්‍රියාත්මක වන්නේ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කිරීමෙන් පසුවය. ඒ අනුව මෙම ඉල්ලුම්කරුට දැව සංස්ථා සභාපතිතුමියගේ ලිපිය සහ 2004.01.01 වැනි දින සිට 07/2003 චක්‍රලේඛනය ක්‍රියාත්මක කර ඇති බව දෙපාර්ශවයේ සාක්ෂි සහ හරස් ප්‍රශ්නවලදී පිළිගෙන තිබීම නිසාත්, ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදු වී නොමැති බව තීරණය කිරීමට සිදු වේ.

මෙම තීරණය සාධාරණ සහ යුක්තිසහගත යයි මගේ නිගමනයයි.

ආර්. එස්. ආරියප්පෙරුම.

2014 ජූනි මස 27 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

08-648

මගේ අංකය : IR/10/40/2010

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

අංක 1861/35 දරන හා 2014.05.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් මුල්ලේරියාව නව නගරය, කොටිකාවත්ත, නො. 103 හි පදිංචි එච්. එම්. ජේ. ආර්. සඳසීලි මැණිකේ හේරත් මිය හා අනෙක් පාර්ශවය වශයෙන් කොලොන්නාව, නිමාව හි පිහිටි සිලෝන් ප්‍රෙටෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුකරු විසින් ලබා දී ඇති අංක A 3378 දරන හා 2014.02.20 දිනැති ප්‍රදානය අවලංගු කරන ලෙසට සිලෝන් ප්‍රෙටෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 3378 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මකවීම 2015.05.08 වැනි දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්. ජේ. එල් යූ. විජයවීර,
*වැ.බ.* කම්කරු කොමසාරිස්.

2014 ජූලි මස 11 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

ලිපිනය : සිලෝන් පෙට්‍රෝලියම්
ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්,
කොලොන්නාව නිමාව,
වැල්ලම්පිටිය.

දිනය : 2014.06.04

කම්කරු කොමසාරිස් වෙතටයි,

2014.05.08 වැනි දින අංක 1861/35 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ද එච්. එම්. ජේ. ආර්. සඳසීලි මැණිකේ හේරත් සහ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් බැඳී සිටින්නා වූ ද 2014.02.20 වැනි දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. එම්. එන්. ඒ. සී. පෙරේරා,
මානව සම්පත් කළමණාකාර,
සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්,
කොලොන්නාව.

පිටපත් : එච්. එම්. ජේ. ආර්. සඳසීලි මැණිකේ හේරත්,
නො. 103, කොටිකාවත්ත,
මුල්ලේරියාව නව නගරය.

08 - 649

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.